චක්‍රලේඛ අංක 93/14

ව.අ.4/සාප 1/2 (V)
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
සංස්කෘතික අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,
බත්තරමුල්ල.

1993 සැප් මස ............... දින

අ.සේ.ම/ලේ.,

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් වෙත,

## පාසල්වල අතිරික්ත ගුරුවරුන් හා විදුහල්පතිවරුන් මාරු කිරීම

ගරු අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිතුමා විසින් පහත සඳහන් තීරණයන් ගන්නා ලදි. කරුණාකර, ඒ පිළිබඳව නොපමාව අවශ්‍ය කටයුතු කරන්න.

1) පාසල්වල සිටින අතිරික්ත ගුරුවරුන් පිළිබඳව නිසි බලධාරීන් වෙත කරුණු ඉදිරිපත් කරනු නොලබන විදුහල්පතිවරුන් පිළිබඳව දැඩි ක්‍රියාමාර්ගයක් ගනු ලැබේ. අතිරික්ත ගුරුවරුන් නොපමාව ඇබෑර්තු ඇති පාසල්වලට මාරු කළ යුතුය.

2) විද්‍යාලයකින් මාරු කරන ලද අතිරික්ත ගුරුවරුන් නිදහස් නොකර සිටින විදුහල්පතිවරුන්ගෙන් එම ගුරුවරයාට ගෙවනු ලබන වැටුප් අය කිරීමට සිදුවේ. එබැවින්, පාසල්වල සිටින අතිරික්ත ගුරුවරුන් මාරු කර ඇති විට ඔවුන් එම විද්‍යාලවලින් නිදහස් නොකරනු ලබන විදුහල්පතිවරුන්ගෙන් එම ගුරුවරුන්ට ගෙවනු ලබන වැටුප් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3) මහා විද්‍යාලවල හා මධ්‍ය මහා විද්‍යාලවල විදුහල්පතිවරුන් මාරු කිරීමේදී අධ්‍යාපන සේවා මණ්ඩලයේ එකඟත්වය ඇතිව මාරුවීම් කළ යුතුය. තව ද, විදුහල්පතිවරුන් මාරු කළ යුත්තේ පාසල් වාරයක් ආරම්භයේදී පමණි.

අ/කලේ
එන්. වී. කේ. කේ. වේරගොඩ
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සංස්කෘතික
ලේකම්

එස්. ඒ. විජේසිංහ
ජ්‍යෙෂ්ඨ ලේකම්

පිටපත:-
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - ද. ගැ හා අ.ක.ස